AL/2018/43/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ක්‍රිස්තියානි ධර්මය II
கிறிஸ்தவம் II
Christianity II

43 S II

2018.08.07 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) ශුද්ධ බයිබලය තුළ අඩංගු ප්‍රධාන කරුණු **හතර** දක්වන්න.

 (ii) ඊශ්‍රායෙලයේ ගැලවීමේ ඉතිහාසය තුළ දිව්‍යසිවර සංකල්පයේ වර්ධනයක් සිදු වී ඇති බව සනාථ කිරීමට කරුණු **හතරක්** සඳහන් කරන්න.

 (iii) ශුද්ධ වූ පාවුලුතුමාගේ පළමු ධර්මදූත චාරිකාවේ ලූස්ත්‍රාවේ දී සිදු වූ වැදගත් සිදුවීම් **හතරක්** ලියන්න. 4

 (iv) මධ්‍යතන යුගයේ ශුද්ධ ලියවිල්ල හැදෑරීමේ දී භාවිත කළ **සිව්විධ** විග්‍රහයන් දක්වන්න.

 (v) ලන්දේසි යුගයේ දී මෙරට තුළ සේවය කළ පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමා විසින් ඉටු කරන ලද සේවාවන් **හතරක්** ලියන්න.

(ලකුණු 04 × 5 = 20යි)

2. (i) නික්මයාම 15:1-21 දක්වා කොටස තුළ සඳහන් මෝසෙස්ගේ ජය ගීතයේ අඩංගු ප්‍රධාන කරුණු **හතර** සඳහන් කරන්න.

 (ii) ප්‍රාතිහාර්යයන් යනු මොනවාදැයි පැහැදිලි කෙරෙන කරුණු **හතරක්** සඳහන් කරන්න.

 (iii) XIII වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා 1878-1903 කාලයේදී තමා විසින් රචිත විශ්ව ලේඛන සඳහා තේමා කර ගත් විෂයයන් **හතරක්** සඳහන් කරන්න.

 (iv) බ්‍රිතාන්‍ය යුගයේ දී උදා වූ පූර්ණ ආගමික නිදහසින් ප්‍රයෝජන ගැනීම පිණිස මෙරට ඔරතෝරියානු නිකායික පියවරුන් ක්‍රියා කළ ආකාරය පෙන්වීමට කරුණු **හතරක්** දක්වන්න.

 (v) පසු කාලීනව ජනවන්දනාවට රෝම සංස්කෘතික මූලාශ්‍රවලින් ලැබුණු ආභාෂ **හතරක්** සඳහන් කරන්න.

(ලකුණු 04 × 5 = 20යි)

3. (i) යෙසායා 11:1-9 ට අනුව සාම රාජ්‍යයේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

 (ii) ක්‍රි.ව. 431 දී පැවැත් වූ එපීසියේ මන්ත්‍රණ සභාවේ දී නෙස්ටෝරියන්වාදයට විසඳුම් පිණිස ගන්නා ලද මූලික තීරණ **හතර** දක්වන්න.

 (iii) මෑත කාලයේ දී රෝමයේ සිදු කළ කැනීම්වලින් සොයා ගෙන ඇති දොමිනිල්ලාගේ සොහොන් ගැබේ තිබී හමු වූ ක්‍රිස්තියානි බිතුසිතුවම්වලට තේමා වී ඇති බයිබලීය කතාන්දර **හතරක්** නම් කරන්න.

 (iv) පහත සඳහන් එක් එක් තාපස නිකායෙහි නිර්මාතෘවරුන් නම් කරන්න.

  (අ) සෙල්ටික්

  (ආ) කැමල්ඩොලෙස්

  (ඉ) කාර්තුසියන්

  (ඊ) සිස්ටර්සියන්

 (v) මෙරට කිතුනු සභා සංවාදයේ සාධනීය ලක්ෂණ **හතරක්** දක්වන්න.

(ලකුණු 04 × 5 = 20යි)

කලා විෂය ධාරාවට අදාල ප්‍රශ්න පත්‍ර,සටහන් ලබා ගැනීමට පිවිසෙන්න www.artsapi.lk වෙත

[ දෙවැනි පිටුව බලන්න.

Scanned by CamScanner

## II කොටස

4. (i) සමදර්ශක සුභාරංචිවල කතෘත්වය සහ රචනා වූ කාලය සම්බන්ධව ඉදිරිපත් වී ඇති නිගමන **පහක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ක්‍රිස්තුන් වහන්සේගේ 'කන්ද උඩ දේශනාව' කිතුනු ඔබගේ ජීවිතයට වැදගත් වන්නේ කෙසේදැයි එහි පරමාර්ථ ආශ්‍රයෙන් උදාහරණ **පහක්** දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

5. (i) "එදා ශුද්ධ වූ සභාව යුරෝපය තුළ අධ්‍යාපනය දියුණු කිරීමට ගත් උත්සාහය යුරෝපයට මෙන්ම සමස්ත ලෝකයටම වැදගත් විය." මෙම ප්‍රකාශයට අදාළව අධ්‍යාපනය සඳහා කිතුනු සභාවේ කැපවීම කරුණු **පහකින්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ශුද්ධ වූ සභා මුල් යුගයේ දී කිතුනුවන් හා ජුදෙව්වන් අතර ගැටුම්වලට තුඩු දුන් සාධක කෙටියෙන් පැහැදිලි කර මෙරට ආගමික සංහිදියාව වර්ධනය කිරීම සඳහා යෝජනා **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

6. (i) පෘතුගීසි යුගයේ ලක්දිවට පැමිණි ධර්මදූතවරුන්ගෙන් සිදු වූ සේවය කරුණු **පහකින්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) මනුෂ්‍යත්වයේ උසස් බව පිළිබඳ කතෝලික සභා ධර්මෝපදේශයෙහි සඳහන් ඉගැන්වීම් ඔබගේ ජීවිතයට සම්බන්ධ කරමින් කරුණු **පහකින්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

7. (i) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා සිදු කළ දයා සේවාවන් **පහක්** සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) බ්‍රිතාන්‍ය යුගයේ දී මෙරටට පැමිණි සිල්වෙස්ත්‍රෝ බෙනදික්තාන නිකායේ ධර්මදූතවරුන්ගේ සේවය පිළිබඳව කරුණු **පහක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10යි)

8. (i) ගරු ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමාගේ ජීවිත කථාව කෙටියෙන් සඳහන් කර, එතුමා විසින් ආධාර ලබන පාසල් (උපකෘත පාසල්) ක්‍රමය පිළිබඳ ඉදිරිපත් කළ යෝජනා **පහක්** සඳහන් කරන්න. (ලකුණු 10යි)

(ii) වත්මන් ලාංකික කිතුනු සභාව මගින් සිදුවන දූත සේවාව අගයමින් කිතුනු සිසුවකු ලෙස ඒ සඳහා ඔබේ දායකත්වය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10යි)

* * *

කලා විෂය ධාරාවට අදාල ප්‍රශ්න පත්‍ර,සටහන් ලබා ගැනීමට පිවිසෙන්න www.artsapi.lk වෙත

www.artsapi.lk

Scanned by CamScanner